# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 161/04 — 1975 අප්‍රේල් 28 වැනි සඳුද — 1975.04.28**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා.කා. අංකය : එන්. 136/75

ජනාධිපතිතුමන් විසින් (393 වැනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 19(1) වැනි වගන්තිය යටතේ, ලංකා පරිපාලන සේවයේ ඩී. කේ. සුබසිංහ මහතා 1975 අප්‍රේල් 18 වැනි දින සිට එකී පනත යටතේ 1975 අප්‍රේල් 2 වැනි දින පත් කරන ලද ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපයේ මැතදී සිදුවූ බව කියන ''නවක වදය'' පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පත්කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. සී. ඩී. විජේසිංහ,
ජනාධිපතිතුමාගේ ලේකම්.

ජනාධිපතිතුමාගේ කාර්යාලය,
කොළඹ, 1975 අප්‍රේල් 23.

4–558

---

**1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත**

33 වැනි වගන්තිය යටතේ වූ ආඥාව

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතෙහි 33 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමති ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ පනවනු ලැබූ 1958 ජනවාරි මස 10 දින අංක 11,237 දරණ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නීතිගත කිරීමේ ආඥාවෙන් පිහිටුවන ලද ජාතික පේෂකර්ම සංස්ථාවේ කාර්යයන් සඳහා මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ඉඩම යෝජිත පරිදි අත්කර ගැනීම මෙම ආඥාවෙන් අනුමත කරමි.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති.

1975 අප්‍රේල් මස 21 දින,
කොළඹ දීය.

**උපලේඛනය**

සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල කෝරලේ උත්තර පත්තුවේ තුල්හිරියෙහි පිහිටි, නුගවෙල ගාව වත්ත නොහොත් නුගවෙළ හේන නොහොත් බුත්වෙල හේන කැල්ල නොහොත් වෙල්ලන් ගොල හේන යන ඉඩම ප්‍රමාණයෙන්, අක්කර හයයි, රූඩ දෙකයි, පර්චස් තිස් හතරයි දශම දෙකයි පහක් වන (අක්. 6, රූ. 2, පර්. 34.25) පහත සඳහන් අයුරින් මායිම් වූ බිම් කොටස:—

උතුරට : රජය සන්තක ඉඩම හා කේ. ඒ. පොඩි මහත්මයා සහ තවත් අයට අයත් ඉඩම ;

දකුණට : ඩී. පී. තේමිස්, ඩී. පී. ගුණදස, ඩී. පී. ප්‍රේමතිලක සහ තවත් අයට අයත් ඉඩම ;

නැගෙනහිරට : ජේ. එච්. සුගතදස සහ තවත් අයට අයත් ඉඩම හා ගම් වැසියනට තිකුත් කර ඇති රජය සන්තක ඉඩම ;

බස්නාහිරට : කොළඹ සිට කැගල්ල දක්වා මහා මාර්ගය.

4–559


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1A—A 13477—4,300 (75/03)